0030

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනපති උපාධි වැඩසටහන -2024/2025
අවසාන පරීක්ෂණය
**STP 9632 - අධ්‍යාපනයේ පරිගණක තාක්ෂණය**
කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2026.02.07 වේලාව : ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
විවිධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී එකම පාඩමක් උදාහරණ ලෙස දැක්වීමෙන් වළකින්න.

01. ශ්‍රී ලංකාවේ යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ප්‍රධාන ප්‍රමුඛතා වන්නේ ඉගෙනුම ලබන්නන්ගේ කුසලතා සංවර්ධනය සහ සුනම්‍යතා තක්සේරුකරණයයි. ඒ අනුව අර්ථවත් ඉගෙනීමක් සහතික කිරීම සඳහා ගුරුවරුන්ගේ භූමිකාව ද වෙනස් වීම අපේක්ෂා කෙරේ.

(i.) සලකා බැලිය යුතු අංග පහක් (05) දක්වමින් "අර්ථවත් ඉගෙනීමක්" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිළි කරන්න. (ලකුණු 30)

(ii.) සුදුසු උදාහරණ තුනක් (03) දක්වමින්, තාක්ෂණය භාවිතයෙන් අර්ථවත් ඉගෙනීම වැඩිදියුණු කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 30)

(iii.) තෝරාගත් පාඩමක් සඳහා තාක්ෂණය යොදා ගනිමින් එය අර්ථවත් කිරීමට ඔබ විසින් ඔබේ සිසුන් සඳහා නිර්මාණය කල ඉගෙනුම් අත්දැකීමක් පැහැදිළි කරන්න. (ලකුණු 40)

02. "තාක්ෂණය යනු යන්ත්‍ර සහ උපාංග එකතුවක් නොව ක්‍රියාකාරී වීමේ ක්‍රමයකි."

(i.) පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අධ්‍යාපන තාක්ෂණයේ භූමිකාවන් අවම වශයෙන් තුනක් (03) ඉස්මතු කරමින් ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 30)

(ii.) තෝරාගත් පාඩමකින් සුදුසු උදාහරණ දක්වමින් උපදේශන මෙවලම් (Instructional tools) සහ උපදේශන ක්‍රියා පටිපාටි (instructional procedures) වෙන්කර දක්වන්න. (ලකුණු 30)

(iii.) තාක්ෂණය හෙබි ඉගෙනීම හරහා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සුනම්‍ය භාවිතයන් ප්‍රවර්ධනය කරන්නේ කෙසේද යන්න උදාහරණයක් සමඟ පැහැදිළි කරන්න. (ලකුණු 40)

03. "බහුමාධ්‍ය ඉගෙනුම් පරිසරයන් සැලසුම් සහ නිර්මාණය කිරීම යනු බහුවිධ මාධ්‍ය එකතු කිරීම පමණක් නොව, විවිධ මාධ්‍ය වර්ග භාවිතා කරමින් ප්‍රතිපත්තිමය උපදේශන නිර්මාණයක් හරහා අර්ථවත් ඉගෙනීම පෝෂණය කිරීමයි."

(i.) බහුමාධ්‍ය නිර්මාණය කිරීමට යොදා ගත හැකි මෘදුකාංග **තුනක් (03)** නම් කර සුදුසු විෂයානුබද්ධ උදාහරණ දක්වමින් ඒවායේ භාවිතය පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii.) අධ්‍යාපනික බහුමාධ්‍ය සංවර්ධනය සඳහා මෘදුකාංග තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු අංශ **පහක් (05)** සාකච්ඡා කරන්න. (ලකුණු 30)

(iii.) පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී බහුමාධ්‍ය ඉගෙනුම් ද්‍රව්‍යවල අධ්‍යාපනික වටිනාකම සහ ඵලදායී භාවිතය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න. (ලකුණු 40)

04. "ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා මාධ්‍යයක් ලෙස, විශ්ව විසිරි වියමන (world wide web-www) වැඩි වැඩියෙන් භාවිත වේ."

(i.) මාර්ගගත (Online) ඉගෙනුම් පරිසර නිර්මාණය සඳහා උපකාරී වන, විශ්ව විසිරි වියමනෙහි ප්‍රධාන ලක්ෂණ **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii.) අදාළ අංශ **තුනක් (03)** ඉස්මතු කරමින් දැනුම ගොඩනැගීමේ මෙවලමක් ලෙස විශ්ව විසිරි වියමනෙහි හැකියාව පරීක්ෂා කරන්න. (ලකුණු 30)

(iii.) (අ) වෙබ් පාදක ඉගෙනුම් ද්‍රව්‍ය සංවර්ධනය කිරීමට සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු අංශ **පහක් (05)** පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ආ) සහයෝගී වෙබ් අඩවියක් සංවර්ධනය කිරීමට දායක වීමේ ඔබේ අත්දැකීම් පිළිබඳ කෙටි ප්‍රත්‍යාවෙක්ෂණයක් ලියන්න. (ලකුණු 10)

05. "TPACK රාමුව යනු ඉගැන්වීම සඳහා තාක්ෂණය ඵලදායී ලෙස සමෝධානය කිරීමට අවශ්‍ය දැනුම පැහැදිලි කරන අධ්‍යාපනඥයින් සඳහා ආදර්ශයකි."

(i.) රූප සටහනක් භාවිතා කරමින් TPACK රාමුවේ ප්‍රධාන සංරචක පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii.) තෝරාගත් පාඩම් කොටසකට අදාළව, තාක්ෂණය පදනම් කරගත් ඉගෙනුම් ද්‍රව්‍යයක් සැලසුම් කිරීමේදී TPACK රාමුවේ එක් එක් සංරචකය සලකා බලන ආකාරය විස්තර කරන්න. (ලකුණු 30)

(iii.) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම සඳහා TPACK රාමුව භාවිතා කිරීමේ වාසි **දෙකක් (02)** සහ අභියෝග **දෙකක් (02)** සාකච්ඡා කර, එම අභියෝග අවම කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 40)

06. "ගුරුවරුන් ඵලදායී, කාර්යක්ෂම සහ ක්‍රියාකාරී ඉගෙනුම් අත්දැකීම්වල නිර්මාණකරුවන් ලෙස ක්‍රියා කරයි."

(i.) තෝරාගත් පාඩමක් සඳහා ඵලදායී, කාර්යක්ෂම සහ ක්‍රියාකාරී ඉගෙනුම් අත්දැකීමක් නිර්මාණය කිරීමට ඔබ සැලසුම් අංග (design aspects) හතර **(04)** සලකා බලන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 40)

(ii.) (i.) කොටසේ විස්තර කර ඇති ඉගෙනුම් අත්දැකීමේ ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සඳහා ඔබ නොමිලේ සපයා ගත හැකි ඩිජිටල් මෙවලම් භාවිතා කර ඇති ආකාරය උදාහරණ තුනක් **(03)** සපයමින් පැහැදිළි කරන්න. (ලකුණු 30)

(iii.) (i.) කොටසේ විස්තර කර ඇති පාඩම සඳහා තාක්ෂණය හෙබි ඉගෙනුම් ද්‍රව්‍ය (TEL) නිර්මාණය කිරීමට ඔබට සහාය වූ ක්‍රමානුකූල උපදේශන සැලසුම් ආකෘතියක (instructional design model) භූමිකාව පරීක්ෂා කරන්න. (ලකුණු 30)

- හිමිකම් ඇවිරිණි. -